# දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය එ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1079/2019 (2019.06.18 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිළධාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - **A** හේවාගම - ලේකම්, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය
පොදු අධිකාරිය - පැමිණ සිටියේ නැත

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.09.12 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.10.10 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.11.12 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.09.12 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *උපාලි ඩී. ලියනගේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය අධිකාරි තනතුරට පත්කර ගැනීමට භාවිතා කල දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ " සාමාන්‍ය අධිකාරි" තනතුරේ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ සහතික පිටපතක්,*

2. *උපාලි ඩී. ලියනගේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය අධිකාරි තනතුරට පත්කරමින් ඔහුට නිකුත් කල විධිමත් පත්වීම් ලිපියේ සහතික පිටපතක්*

**3.** *උපාලි ඩී. ලියනගේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය අධිකාරි තනතුරට පත්කිරීමට අනුමැතිය ලබා දී ඇති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය සහ ඊට අදාල අධ්‍යක්ෂක මණ්ඩල සංදේශයේ පිටපතක් හා අධයක්ෂක මණ්ඩල තීරණය ලබා දීමට සහභාගීවී ඇති දකුණු පළාත් සභාවේ සේවය කරන අධයක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ නම්*

**4.** *උපාලි ඩී. ලියනගේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය අධිකාරි තනතුරට අයදුම් කල අවස්ථාවේදී සාමාන්‍ය අධිකාරි තනතුරට අයදුම් කල සියලු අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම, තනතුර සහ ඔවුන් සේවය කරන ආයතනයේ නම යන කරුණු වෙන වෙනම*

**5.** *ඉහත කී අවස්ථාවේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය අධිකාරි තනතුරට අයදුම් කල අයදුම්කරුවන්ගේ සුදුසුකම් සම්බන්ධව ඉහත කී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ වාර්තාවේ සහ ලකුණු දීමක් සිදුකර ඇත්නම් එම ලකුණු අඩංගු වාර්තාවල සහතික පිටපත්*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.10.10 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.11.12 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**නියෝගය:**

පොදු අධිකාරිය පැමිණ සිටියේ නැත.

අභියාචක සේවක සංගමය තොරතුරු ඉල්ලීම සිදු කිරීමේදී පනතේ 43 වගන්තිය ප්‍රකාරව තම පුරවැසිභාවය සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කර නොමැත. පනතේ 43 වන වගන්තිය "පුරවැසියා" යන්න මෙසේ අර්ථකථනය කරයි.

> *"යම් ව්‍යවස්ථාපිත හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමිජිකයින්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුලත් වේ"*

අභියාචක සංගමය හට මීළඟ කැඳවීම් දිනයට පෙර තම සේවක සංගමයේ පුරවැසිභාවය පිළිබඳව ලිඛිතව කොමිෂන් සභාව වෙත දැනුවත් කිරීමට මෙයින් නියෝග කෙරේ.

තවද, පොදු අධිකාරිය විසින් මේ වෙනතෙක් අභියාචක සේවක සංගමය හට ලබා දී ඇති, ලබා දී නොමැති සහ ලබාදුන් නමුත් අපැහැදිලි තොරතුරු අයිතම මොනවාද යන්න, එම තොරතුරු ලබාදුන් දිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කොමිෂන් සභාව හට මීළඟ කැඳවීම් දිනයේ දැන්වීමට අභියාචක සේවක සංගමයට නියෝග කෙරේ.

තවද, තොරතුරු පනතේ 39(1)(ඇ) වගන්තිය කෙරෙහි පොදු අධිකාරියේ අවධානය යොමු කෙරේ.

> *"39 (1) කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන*

*(ඇ) සෑම තැනැත්තෙකුම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත් වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතුය"*

පොදු අධිකාරියේ නොපැමිණීම මත මීළඟ අභියාචනා විභාගය සඳහා පොදු අධිකාරියේ පැමිණීම අනිවාර්ය වන අතර පනතේ 39(1)(ඇ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලැබීම වරදට වරදකරු විය හැකි බවටත් පොදු අධිකාරියට මින් දන්වා සිටිනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම දිනය: 2019.10.22

****

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1079/2019 (2019.10.22 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිළධාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - **A** හේවාගම - ලේකම්,
දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය
පොදු අධිකාරිය - ඩී.ඩී. රේණුකා, පරිපාලන නිලධාරී,
දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇත්තේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු සාමාන්‍යාධිකාරී උපාලි ඩී ලියනගේ මහතා එම තනතුරින් ඉවත් කළ පසු ඒ සඳහා ඔහුව එම තනතුරට පත් කරන ලද බවත් නිලධාරී වෙනස් වීමට අනුව මෙතෙක් තොරතුරු නිලධාරීන් පත් කිරීමට නොහැකි වූ බවත් අභියාචනා විභාගය සඳහා පරිපාලන නිලධාරී ඩී.ඩී. රේණුක මහත්මිය ඒ සඳහා යොමුකරන ලද බවත්ය.

කෙසේ වෙතත් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ අදාළ පොදු අධිකාරියේ නිලධාරී වෙනස් වීම මත තොරතුරු නිලධාරී මෙතෙක් පත්කර නොමැති වීම සිදු නොවිය යුත්තක් බවත් අභියාචනා විභාගය සඳහා තොරතුරු නිලධාරීගේ සහභාගීත්වය මෙහිදී අවශ්‍ය වන බවයි.

පෙර අභියාචනා විභාගයේදී කොමිෂන් සභාව විසින් අභියාචකට නියෝග කරන ලද පරිදි, අභියාචක සංගමය විසින් පනතේ 43 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් බව සනාථ කිරීමට අවශ්‍ය ලේඛන කොමිෂන් සභාවට එවා ඇති අතර පොදු අධිකාරිය විසින් මේ වෙනතෙක් අභියාචක සේවක සංගමය හට ලබා දී ඇති, ලබා දී නොමැති සහ ලබාදුන් නමුත් අපැහැදිලි තොරතුරු අයිතම මොනවාද යන්න, එම තොරතුරු ලබාදුන් දිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කොමිෂන් සභාවට යොමුකර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

පළමු හා දෙවන අයිතම හැරුණු කොට තෙවන, සිව්වන හා පස්වන අයිතමයන්ට අදාළ තොරතුරු ලැබී නොමැති බවයි.

අදාළ ලිපිගොනු පරීක්ෂා කර බලා අදාළ තොරතුරු දින දහහතරක් ඇතුළත් අභියාචක සංගමය වෙත ලබාදීමට පොදු අධිකාරිය විසින් එකඟ වන ලදි.

නියෝගය:

මේ අනුව අදාළ ලිපිගොනු පරීක්ෂා කර බලා අදාළ තොරතුරු කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත සති දෙකක කාලයක් තුළ ලබාදිය යුතු බවට පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****